**මන්නාරම ප්‍රාදේශීය සභාව**
**මන්නාරම දිස්ත්‍රික්කය**
**-----------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 21 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මන්නාරම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණ විය.

(අ) මන්නාරම නගර සභාවෙන් ලැබියයුතු එකතුව රු. 1,918,389 ක්වූ විශ්‍රාම වැටුප් දායක මුදල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි.

(ආ) සමාලොචිත වර්ෂයේ එකතුව රු. 54,446,893 ක්වූ මූලධන වියදම්වලින් රු. 40,562,875 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් රු. 40,562,875 ක වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සභාවට පරිත්‍යාග වශයෙන් ලැබුණු පරිඝනක සහ ලී බඩු උපකරණ අයිතම් 03 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙනවිත් නොතිබීමෙන් එහි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසැඳුනු ගිණුම්

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් සභාවේ ලේඛන අනුව රු. 3,761,548 ක් වුවත්, සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල රු. 1,004,647 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 2,756,901 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 178(3) | - | කොන්ත්‍රාත් වැඩ සාර්ථකව ඉටුකරන ප්‍රජා සංවිධාන, ප්‍රජා මධ්‍යස්ථානවල නම් ඇතුලත් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii)රීති 218 | - | ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයට එක්වරක් හෝ ලේකම් විසින් පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 571 | 88,443 | කල් ඉකුත්වූ තැන්පත් 23 ක් සම්බන්ධයෙන් කටයුතු නොකර පසුගිය වර්ෂ 03 ක සිට වර්ෂ 33 දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 9,194,743 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 12,896,804 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | --------- | ------------- | --------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- | ------------- |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 415,000 | - | 199,484 | (215,516) | 319,000 | - | 313,232 | (5,768) |
| (ii) | කුලී | 9,114,600 | - | 9,187,230 | 72,630 | 4,301,652 | - | 8,850,411 | 4,548,759 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,439,500 | - | 1,716,450 | 276,950 | 1,222,900 | - | 1,528,415 | 305,515 |
| (iv) | සේවා ගාස්තු | 550,800 | - | 593,379 | 42,579 | 1,239,900 | - | 820,793 | (419,107) |
| (v) | වරෙන්තු ගාස්තු | 1,429,000 | - | 3,248,451 | 1,819,451 | 6,933,000 | - | 1,767,220 | (5,165,780) |
| (vi) | වෙනත් ආදායම් | 6,520,060 | - | 8,272,062 | 1,752,002 | 4,798,183 | - | 5,449,827 | 651,644 |

### 2.2.2 කුලී

----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බදු හා බදු කුලී හිමියන්ගෙන් 113 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ බදු හා බදු කුලී වල එකතුව රු. 1,866,119 ක මුදල අයකර ගැනිම සඳහා පසුගිය වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා සභාව විසින් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ දෙපාර්තමේන්තු, සමිති පූජනීය ස්ථාන සහ සභාවන් වෙත ජෙසීබී, මෝටර් ග්‍රේඩර් සහ රෝඩ් රෝලර් බදු දීම වෙනුවෙන් ලැබිය යුතු රු. 102,700 ක හිඟ මුදල අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ නිලධාරින්ට පුහුණු ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වෙන්කරන ලද මුදලින් සියයට 15 ක් වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි.

(ආ) තලෙයි මන්නාරම පියර්, පේෂාලයි සහ තිරුක්කෝනීස්වරම් යන ප්‍රදේශයන් සංචාරක ආකර්ෂන ප්‍රදේශයන් වුවද, එම ප්‍රදේශ සංවර්ධනය කර සංචාරක ක්ෂේත්‍රය මගින් වාර්ෂිකව ලබාගත හැකි ආදායම් වැඩිකර ගැනීම සඳහා සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

### 3.2 වත්කම් කළමනාකරණය

----------------------------

#### 3.2.1 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තලෙයි මන්නාරම ග්‍රාමයේ ඉදිකර සභාව වෙත භාර දි තිබූ සත්ව ඝාතනාගාරය ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ආ) පේෂාලෙයි හි අළුතින් ඉදිකරන ලද මහජන පුස්තකාලය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) තලෙයි මන්නාරම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 03 ක් බදු දීමකින් තොරව වසාදමා තිබුණි.

**3.2.2 නඩත්තු හා අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීම**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු. 6,130,000 ක් වටිනා වාහන 05 ක් පසුගිය වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා අළුත්වැඩියා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතිණි.

(ආ) තලෙයිමන්නාරමෙහි ඉදිකරතිබූ උද්‍යානය නිසි පරිදි නඩත්තු කර ප්‍රයෝජනයට ගත හැකි තත්වයෙන් තබාගැනීමට සභාව අපොහොසත්විය.

(ඇ) ධාවනය කළහැකි තත්වයේ තිබූ සභාව සතු වාහන 06 ක් ධාවන කිරීමට හැකිවන පරිදි අළුත්වැඩියාකර නඩත්තු කිරීමට සභාව ක්‍රියාකර නොතිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

සභාවේ කටයුතු විගණනය කර එහි ක්‍රියාකාරකම් කාර්යක්ෂමතාවයෙන් කරගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනය පරික්ෂණ වලින් ලද නිර්දේශයන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**5 පද්ධති හා පාලනය**

විගණනයේ නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

.

| | පද්ධතිය | අඩුපාඩු |
|---|---|---|
| (අ) | ආදායම් | සභාව බලප්‍රදේශයේ දේපළ තක්සේරුකර වරිපනම්බදු අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණු. |
| (ආ) | ලැබිය යුතු ගිණුම් | හිඟ ආදායම් සහ ගාස්තු අයකිරීම සඳහා ආදායම් පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) | වත්කම් | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි, මාර්ග, සුසානභූමි, සාතකාගාර බලපත්‍ර ගාස්තු ලේඛන ගත කර නොතිබුණි. |
| (ඈ) | ගිණුම්කරණය | පොදු ලෙජරය සහ ප්‍රධාන ලෙජරය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |